# තුඩිල ජාතකය

තවද මහපොළොවසේ විපුලවූ ගුණ ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ වේළුවනාරාමයහි වැඩ වසන සමයෙහි මරණභිරුක භික්ෂු කෙණකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්

එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ රාත්‍රී ස්ථාන දිව්‍යස්ථාන චංක්‍රමන ස්ථානයට ගියතෙන පරඬලාපතත්වත් කොටුවක්වත් පක්ෂිකෙණෙකුන් අඬාපුවක් වත් අසා මරණභයින්න භිරුකව වාසය කරණ කල්හි මේ කථාව දම්සභාමණ්ඩපයේ රැස්වු මාළුවරුන් වහන්සේ කිය කියා වැඩඋන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා සර්වඥයන් වහන්සේ මහණෙනි මේ  භික්ෂූහු දැන්මතුනොවෙයි පළමුත් මරණභයින් යුක්තව විසුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ එක් ඊරියකසේ කුස පිළිසිඳගත් කල්හි නොබෝකලනින් වැදුහ. දෙවැනිව කුඩා ඌරුපැටියෙකුත් වැදූහ. ඌරු පැටියන් දෙන්නා තුරුල්ලේ ලාගණ ඊරිය වැදොත්තැනට මැල්ලක් තමාගේ කපුසේනට ගොසින් කපුකඩාගෙණ එනතැනැත්ති ඊරිය වැදොත්තෙනට ආවා, ඊරිය තමා මරති යන භයින් පැටියන් දෙන්නා වැදොත්තදී පළාගියහ. මැලි ඌරුපැටියන් දෙන්නාගෙණ මහපැටියාට මහා ඩිලයෝය කුඩා පැටියාට කුඩාතුඩිලයෝයයි නම් තිබා ඌරු පැටියන් දෙන්නා පුත්‍ර ප්‍රේමයෙන් වඩන්නේය. එසමයෙහි රාසොඬුන් එක් දවසක් රා බී මාංශනොලැබ අසවල් මැල්ලාගේ ගෙයි ඌරෝ ඇත. උන් අතින් ඇරගෙණ මරාකම්මැයි කියා අවුත් කියන්නාහ. මැල්ල තොපගේ ගෙයි වඩන ඌරෝ ඇත අපගෙන් මිල ඇගෙණ උන්දෙවයි කීහ. මැලි කියන්නී මාගේ දරුවන් දීපියා  දමා සම්පත් ලබන්නේයයි කියා නොගිවිස්සා රා සොඬු මැල්ල රා පොවා මත්කොට කියන්නාහු අපට ඌරන් දෙව්වැයි විචාළේය. මැලි රා බී මත්ව යාපත දෙමි ඉනුත් මාගේ වැඩිමහළු තුඩිලයන් නොදෙමි කුඩා තුඩිලයන් දෙමි කීහ. යහපතැයි මැලි පුත්වුල්ල කුඩිලයෙනි මෑත එවයි අඟාළුහ. බෝධිසත්වයෝ සිතන්නාහු මාගේ මෑනියෝ මෙතෙක් දවසක් පළමුවෙන් මට අඬාගාතොත් විනා චුල්ල තුඩිල්ලයන් අඬනොගාතිය අද යම්සේ මෑනියන්ට භයෙක් ඇතමැනවැයි සිතා මල තුඩිලයෙනි තොපගේ මෑනියෝ තොපට අඬගාතියි ඔබට යවයි කිව. යහපතැයි චුල්ල තුඩිලයෝ මෑනියන් සිටිනා තැනට වෙවුලා බෑනන් කරා ගියහ. මහතුඩිලයෝ කින්දැයි විචාළකල මෑනියන් හා රා සොඬු වටකොට ගෙණ සිටිනියාවත් බත් ඔරු තිබූනියාවත් දැක භයින් ත්‍රස්තව දිවආමි කීහ. බෝධිසත්වයෝ මළනුවන්ට කියන්නාහු මල ඌරන් ගෝනන් මුවන් ආදීවූ සිව්පාවන් වඩන්නේ අනික් නිසා නොවෙයි යමෙක්වේලේ මරන්ටමය එසේ පැමිණ මරණට හිරුකවිමෙන් කම්කිම්දැයි කියන්නාහු අවවාද බරණැස් නුවර මුලුල්ලට සැලව ගිය හෙයින් රජ්ජුරුවන් හා නුවරවාසීන් එක්වී බෝධි සත්වයන් උන්නාවූ බැද්ද වට කොට ගත්හ. බෝධිසත්වයෝ මලනුවන්ට අවවාද කියන්නාහු මලනුවෙනි යහපත්ව පෑදී තිබෙන පැනෙන් ඉස්සෝදා නාහා ඇඟ කුණු ඇර පියව ශරීරයේ නොයෙක් සුගන්ධයන් ගාගනුවයි අවවාද කීහ. එවිට කුඩා කුඩිලයෝ කියන්නාහු අපගේ ඌරන්ගෙන් කුනුඅරවා වාසය කළ කෙණෙක් ඇද්ද? ශරීරයෙහි යහපත් සුගන්ධය ගෑ කෙණෙකුන් නැතිව ඉන්දදී බෑනන් වහන්ස. මේ කුමට කියන කාරණයෙක් දැයි විචාළාහ. බෝධිසත්වයෝ එවිට මා කීයේ විලට බැස අකුසල් නැමති ශරීර මලය පහකොට කුසල් නැමති මනාවූ තොටට බැස නාහා සියලු දවස් ශරීරය නොහැර පවත්නාවූ සිල් නැමති සුගන්ධය ශරීර යේ ගල්වන්ට මා කියේ යයි කියා මලනුවෙනි යම් කෙනෙකුන් අකුසලයක් කෙරෙත් නම් ඊට සතුටුවිමෙන් දුක් බොහෝ දෙලොවටම පැමිණෙන්නේය. යම් කෙණකුන් කුසලයක් කෙරෙත් නම් ඊට සතුටු වීමෙන් දෙලොවම සැප එලවන්නේය. එසේ හෙයින් අකුසලය කරණ කෙණෙකුන්ටවත් සිතන කෙණෙකුන්ටවත් සතුටුවීමෙන් මරණාසන්නයෙහිත් සෙසු වේලෙහිත් මහාභය පැමිණෙන්නේය. එසේහෙයින් එසේවූ අකුසලය ශීල නමැති සුගන්ධය ශරීරයේ ගල්වා ගනුවයි කීය. බෝධිසත්වයන් බුද්ධවිලාසයෙන් ඉඳ කියන්නාවූ අවවාද රජ්ජුරුවෝ අසා මහා සමාධිව බෝධිසත්වයන් යහපත් ඉනකඩකුත් අඳවා මාණික්‍යාභරණයකුත් පලඳවා බෝධිසත්වයන් වැවු මැල්ලටත් බොහෝ සම්පත් දී බෝධිසත්වයන් හා මලනුවන් ද බරණැස් නුවරට ගෙණගොස් රජගෙයි ඉන්නට සලස්වා සියලු අධිකරණ ආදීවූ යුක්ති අයුක්ති බෝධිසත්වයන් විචාරා මැදහත්ව නිශ්චයකොට සියලු මනුෂ්‍යයන්ට පන්සිල් අටසිල් ආදීවූ දානාධ්‍යාසයෙහි පිහිටුවා අපායට යානොදී සුගතියට පමුණවන්නාහ. බොහෝ කලකින් බරණැස් රජ්ජුරුවෝ මළහ. බෝධිසත්වයෝ රජ්ජුරුවන්ට කළමනා ආදාහණ කෘත්‍යකොට නිමවා ඉක්බිති අධිකරණ

ශාස්ත්‍රය බෝධිසත්වයෝ පොත් බලා ලියවා මේ නියාවට අධිකරණ ඉදිරියේ විචාරවයි කියා නුවරවාසීන් එක්කරවා බොහෝ මනුෂ්‍යයන්ට අවවාද කියා බෝධිසත්වයන් හා මලනුවෝ බොහෝ මනුෂ්‍යයන් අඬ අඬා සිටියදී තමන්ගේ පළමුවිසූ වනාන්තරයට ගියහ. එදා උෟරුතුඩින් වදාළ බණ සැටදහසක් අවුරුදු පැවැත්තේ යයි  වදාරා මේ තුඩිල ජාතකය නිමවා වදාළසේක. මේ දේශනාවසානයෙහි මරණ හිරුක භික්ෂූන් වහන්සේ සෝවාන් වූසේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය. එසමයෙහි චුල්ලතුඩිල්ල කුමාරයෝ නම් හිරුක භික්ෂූහුය. එසමයෙහි මහාතුඩිල්ලව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.